Department of Education, Sabaragamuwa Province/ Weekly School



තොරතුරු පත්‍රිකාව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

<u>පැවරුම</u>

1. ආනුෂංගික අංග යනු මොනවාදැයි පැහැදිලි කරන්න.
2. ඔබ නැරඹූ නාට්‍යයක ආනුෂංගික අංග භාවිත කර තිබූ ආකාරය වෙන වෙනම විස්තර කරන්න.
3. ඔබ විසින් පෙර සතියේ නිර්මාණය කරන ලද නාට්‍ය පිටපතට අවශ්‍ය ආනුෂංගික අංග සැලසුම් කරන්න.
4. එම සැලසුම්හි දළ සටහන් අදින්න.(උදා:- වේෂභූෂණ, පසුතල නිර්මාණ, රංගභාණ්ඩ.....)

*තොරතුරු පත්‍රිකාව*

## <u>ආනුෂංගික අංග හඳුනා ගනිමු.</u>

අනුශාංගික අංග යනු නාට්‍යයක් සාර්ථක කර ගැනීම සඳහා නළුවාට බාහිරින් එකතු කර ගන්නා වූ සියලු ම අංගයන් වේ. සතර අභිනයේ අහාර්ය අභිනය ඇතුළත් වන්නේද ආනුෂාංගික අංගය එසේම අනෙකුත් අභිනයට සාර්ථක කරගැනිමට පිටිවහල සපයන්නේද මෙම ආනුෂාංගික අංගයි.

<u>නාට්‍යක දක්නට ලැබෙන ආනුෂංගික අංග</u>

- ✓ **වේෂ භූෂණ (රංග වස්ත්‍රාභරණ)**
- ✓ **පසුතල නිර්මාණ**
- ✓ **අංගරචනය**
- ✓ **නාට්‍යය සංගීතය**
- ✓ **ආලෝකකරණය (රංගාලෝකය)**
- ✓ **නාට්‍යෝපකරණය**
- ✓ **රංග වින්‍යාසය**

එම ආනුෂංගික කලා මඟින්

- ✓ නළුවාගේ රංගය වඩාත් තීව්‍ර කරලීම උදෙසා ඉහත කී අංග භාවිතා කරයි.

- ✓ නාට්‍ය යේ ශෛලිය අනුව අනුශාංගික කලාවන්ගේ ස්වභාවය වෙනස් වේ.

**<u>පොදුවේ ගත් කල ආනුෂංගික කලාවන් භාවිත කිරීමේදී සැලකිලිමත් විය යුතු ප්‍රධාන කරුණු ලෙස</u>**

- ✓ නාට්‍ය ශෛලියට ගැළපිය යුතුය.
- ✓ ප්‍රවාහනයේ පහසුව
- ✓ ආභරණ සකස් කිරීමේදී සාමාන්‍ය ජීවිතයේ පළඳින ආභරණවලට වඩා විශාල ලෙස සකස් කිරීම.
- ✓ නළු නිළියන්ට අපහසුවක් නොවන ලෙස ආනුෂංගික අංග භාවිතය
- ✓ වියදම් අඩු සරළ සහ ශක්තිමත් අමුද්‍රව්‍ය යොදා ගනිමින් පසුතළ සකස් විය යුතුය.
- ✓ නාට්‍ය නිර්මාණයට අදාල අවස්ථාව කාලය, දේශය ආදිය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
- ✓ වේෂභූෂණ නිර්මාණයේදී ඉතාම ලෙහෙසියෙන් පැලදිමට හා ගැලවිමට පහසු විය යුතු අතර සැහැල්ලු විය යුතුය.

සැකසුම :- කේ.එම්.චතුරිකා ප්‍රියදර්ශනී

ර/නිවි/කහවත්ත ම.ම.වි.